ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107(5) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය අධීක්ෂණය කිරීම සම්බන්ධව සමස්තයක් ලෙස බැලීමේ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07හි 22ඡේදය අනුව ගොඩනැගිලි නැවත ප්‍රතිස්ථාපනය සඳහා සමාලෝචිත වර්ෂය තුළ වැය කර තිබූ රු.18,445,093ක් ගොඩනැගිලි ගිණුමට ප්‍රාග්ධනිත කිරීමකින් තොරව වියදම් ලෙස ගිණුම්ගත කර තිබීම හේතුවෙන් ගොඩනැගිලි ගිණුමේ ශේෂය හා වර්ෂයේ අතිරික්තය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	විදුලි රැහැන් ඇදීමට සහ රාක්ක සකස්කිරීම් සඳහා ගිය වියදම් පිළිවෙලින් රු.7,715,487ක් හා රු.369,410ක් ප්‍රාග්ධනිත නොකිරීම නිවැරදි නොවීම පිළිගන්නා බව හා අනෙකුත් වියදම් ගොඩනැඟිලි අළුත්වැඩියා වියදම් වන බැවන්, පසු කාලීන පිරිවැය ලෙස සලකා ධාරන අගයට එකතුවක් ලෙස හඳුනා නොගන්නා ලද බව.	වියදමේ ස්වභාවය නිවැරදිව හඳුනාගෙන ප්‍රාග්ධනිත කිරීමට කටයුතු කල යුතුය.
(ආ)	ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 10 හි 19 ඡේදය අනුව සේවා සැපයීම ඇතුලත් ගණුදෙනුවක ප්‍රතිඵලය විශ්වාසවන්ත ලෙස ඇස්තමේන්තු කල හැකි විට වාර්තා කරන දිනයේදී ගණුදෙනුවේ සමාප්ති තත්ත්වය සැලකිල්ලට ගෙන ගණුදෙනුව ආශ්‍රිත අයභාරය හඳුනාගත යුතු අතර නැතහොත් 24 ඡේදය අනුව නියමිත කාල රාමුව (පරාසය) තුල දී සරල මාර්ග ක්‍රමය මත අයභාරය හඳුනාගත යුතුය. ඊට පටහැනිව ස්වයං මූල්‍ය පාඨමාලාවලින් ලැබෙන ආදායම හා	විශ්වවිද්‍යාල පනතේ 99 වගන්තිය යටතේ විශ්වවිද්‍යාල අරමුදල ව්‍යවස්ථාපිත අරමුදලක් වන අතර 101 වගන්තිය යටතේ උප ගිණුම්වල පවත්වාගෙන යාමේ බලතල මූල්‍යාධිකාරී සතු බව හා එම නිසා ව්‍යවස්ථාපිත නොවන අරමුදල් කිසිවක් විශ්වවිද්‍යාලය සතු නොවන බව. විවිධ ආකාරයට ලැබෙන අරමුදල් ගිණුම් තැබීමේදී සියළු විශ්වවිද්‍යාල එකම පිළිවෙතක් අනුගමනය නොකරන නිසා මේ සම්බන්ධයෙන්	ආදායම් හා වියදම් අදාළ කාලපරිච්ඡේදය තුළදී හඳුනාගැනීමට කටයුතු කළ යුතුය.

වියදම එම පාඨමාලාවට අදාළ කාලපරිච්ඡේදය තුළදී හඳුනා නොගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට කලින් ලද කෙටිකාලීන පාඨමාලා ආදායම් ලෙස රු.387,379,120ක ශේෂයක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම බැරකම් යටතේ දක්වා තිබුණි.	තීරණයක් ගැනීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මූල්‍යාධිකාරීවරු සමඟ සාකච්ඡා කල අතර, ඒ සම්බන්ධයෙන් නව චක්‍රලේඛයක් නිකුත් කිරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් දන්වා ඇති බව.	

1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ශිෂ්‍යාධාර ලබාදීම සඳහා විශ්වවිද්‍යාලයේ පාඨමාලා ගාස්තුවෙන් වාර්ෂිකව වෙන්කරනු ලබන සියයට 4ක ප්‍රමාණය වර්ෂයේ වියදමක් ලෙස හඳුනාගැනීම විශ්වවිද්‍යාලයේ ප්‍රතිපත්තිය වුවද සමාලෝචිත වර්ෂයේදී ශිෂ්‍යාධාර ලබාදීම සඳහා වෙන්කරනු ලැබූ රු.64,482,000ක මුදල වර්ෂයේ වියදමට හා ශිෂ්‍යාධාර අරමුදලට ගිණුම්ගත නොකිරීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා ශිෂ්‍යාධාර අරමුදල එම ප්‍රමාණයෙන් පිළිවෙලින් වැඩියෙන් හා අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව.	වර්ෂයේ වියදම් අදාළ කාලපරිච්ඡේදයට නිවැරදිව හඳුනාගත යුතුය.

1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2016 මාර්තු 01 දිනැති අංක 04/2016 දරන චක්‍රලේඛය අනුව ස්වයං මූල්‍ය ආදායමෙන් සංවර්ධන අරමුදල් සඳහා වන දායකත්වය විශ්වවිද්‍යාල අරමුදලට මාරුකිරීම හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මගින් සිදුකළ යුතු වුවද ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත වර්ෂයේදී සංවර්ධන අරමුදල් දායකත්වය ලෙස රු.64,143,842ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ වියදමක් ලෙස ගැලපුම් කර තිබීමෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත පුනරාවර්තන අරමුදල එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.	විවිධ ආකාරයට ලැබෙන අරමුදල් ගිණුම් තැබීමේදී සියළු විශ්වවිද්‍යාල එකම පිළිවෙතක් අනුගමනය කිරීමට නව චක්‍රලේඛයක් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති විසින් නිකුත් කිරීමට කටයුතු කරන බව.	විශ්වවිද්‍යාල අරමුදලට මාරුකිරීම් හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය මගින් සිදු කිරීමට කටයුතු කල යුතුය.

(ආ)	සමාලෝචිත වර්ෂය තුළදී ස්ථාවර තැන්පතුවලින් උපයන ලද රු.44,708,669ක පොලී ආදායම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ආදායම් ලෙස හඳුනාගැනීමකින් තොරව සෘජුවම අරමුදල් ගිණුම්වලට බැර කර තිබුණි.	-එම-	වර්ෂයට අදාල සියළු ආදායම් වර්ෂයේ ආදායමක් ලෙස හඳුනා ගැනීමට කටයුතු කල යුතුය.
(ඇ)	2023 වර්ෂයේ දී සිදුකළ රු.8,024,655ක අධි වෙන්කිරීම් ඉදිරියට ගෙනවිත් තිබූ ලාභයට ගැලපීමකින් තොරව, සමාලෝචිත වර්ෂයේ වියදම්වලින් අඩුකර දැක්වීම හේතුවෙන් වර්ෂයේ අතිරික්තය හා සමුච්චිත අතිරික්තය එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් දක්වා තිබුණි.	2025 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව	ප්‍රමිති ප්‍රකාරව වෙන්කිරීම් සඳහා ගිණුම්තැබීමට කටයුතු කල යුතුය.
(ඈ)	සෞඛ්‍ය විද්‍යා පීයයේ පස්මහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවට අදාලව 2019 වර්ෂයේ පළමු බිලෙන් අඩු කරන ලද රු.3,239,672ක රඳවා ගැනීම් මුදල ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල කෙරීගෙනයන වැඩ ගිණුම හා රඳවාගැනීම් ශේෂය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට අදාළ නිළධාරීන්ට උපදෙස් ලබාදුන් බව.	රඳවාගැනීම් නිවැරදිව ගිණුම්ගත කිරීමට කටයුතු කල යුතුය.
(ඉ)	මුද්‍රණාලය විසින් වෙනත් ආයතන සඳහා මුද්‍රණ කටයුතු ඉටුකර දීම වෙනුවෙන් 2013 වර්ෂයේ සිට ලබාගෙන තිබූ රු.1,204,594ක් වූ අත්තිකාරම් අදාළ කාර්යයන් නිමකර තිබියදී ආදායමට ගැනීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් සමුච්චිත අතිරික්තය හා අත්තිකාරම් එම ප්‍රමාණයෙන් පිළිවෙලින් අඩුවෙන් හා වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	අදාළ ගිණුම් නිරවුල් කිරීමට කටයුතු කරන බව.	කාර්යය නිමවූ විගස අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ලැබිය යුතු මුදල්

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට රු.932,483,803ක් වූ ලැබිය යුතු ශිෂ්‍ය ආදායමට අදාලව කාල විශ්ලේෂණයක් විගණනයට ඉදිරිපත්	OMIS පරිගණක පද්ධතිය තුල 400,000කට නොඅඩු ශිෂ්‍ය සංඛ්‍යාවකගේ තොරතුරු ඇතුලත් වන බැවින් එම පද්ධතියේ ඇති අඩු	කාල විශ්ලේෂණ තොරතුරු විගණනයට ඉදිරිපත් කිරීමට

	නොකෙරුණි.	ලුහුඩුකම් මත නිවැරදි කාල විශ්ලේෂණයන් ලබාදීමට නොහැකි වී ඇති බව.	කටයුතු කල යුතුය.
(ආ)	වර්ෂ 09 සිට 32 දක්වා පැරණි සේවය අතහැර ගිය නිලධාරීන් 07දෙනෙකුගෙන් අයවිය යුතු රු.485,128ක ආපදා ණය ශේෂයන් අදාළ නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා මුදල් අංශය වෙත ලද අයගෙන් හා අර්ථසාධක අරමුදල් නිදහස් කිරීමේ පත්‍රිකා ලද පසු අනෙක් අයගේ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු සිදුකරන බව.	සේවය අතහැර ගිය නිලධාරීන්ගේ ණය ශේෂයන් පියවා ගැනීමට කටයුතු කළ යුතුය.

1.6.2 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2018 සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින දක්වා භාණ්ඩ මිලදී ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු රු.16,220,166ක මුදලක් නිරවුල් කිරීමකින් තොරව ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.	2025 වසර තුලදී නිරවුල් කිරීමට කටයුතු කරන බව.	ගෙවිය යුතු මුදල් ගෙවා නිදහස් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය සහ 2019 ජූලි 29 දිනැති අංක 04/2019 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අභ්‍යන්තර විගණන චක්‍රලේඛය	විෂයභාර අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව විශ්වවිද්‍යාලය විසින් 2024 දෙසැම්බර් 31 දිනට රු.3,315,778,764 ක් ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි.	භාණ්ඩාගාර අනුමැතිය ලැබෙන තුරු කෙටිකාලීන ආයෝජන ප්‍රමාද කල නොහැකි බැවින් භාණ්ඩාගාර නිලධාරීන්ගේ උපදෙස් මත අයෝජන අවස්ථාවේදීම භාණ්ඩාගාර අනුමැතිය සඳහා ඉල්ලීම් ලිපි භාණ්ඩාගාරයට යොමුකර ඇති බව.	මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය			

(i)	මුදල් රෙගුලාසි 571	එකතු වටිනාකම රු.16,626,979ක් වූ වර්ෂ 02ක් ඉක්මවූ රැඳවුම්, ලංසු සුරක්ෂණ හා කාර්යසාධන සුරක්ෂණ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	ලංසු සුරක්ෂණ හැකි ඉක්මනින් නිදහස් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ii)	මුදල් රෙගුලාසි 756	සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට පිරිවැය රු.350,821,276ක් වූ පුස්තකාල පොත් සම්බන්ධයෙන් තොග සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.	2024 වසරේදී පුස්තකාල පොත් තොග සමීක්ෂණයක් සිදු නොකල බව හා 2025 වසරේදී සමීක්ෂණයක් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව.	-එම-
(iii)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(5)	2019 සිට 2024 වර්ෂය දක්වා කාලය තුළ ලබා දී තිබූ එකතුව රු.1,089,952ක තත්කාර්යය අතුරු අග්‍රිම 33ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.	නොදන්වා සේවයෙන් ඉවත් වූ සේවකයාගේ අතුරු අග්‍රිමය අර්ථසාධක අරමුදල නිදහස් කිරීමේදී ද, 2023 වර්ෂය අදාල රු.30,090ක ගෙවීම් සම්බන්ධ විමර්ශණය අවසන් වූ විට ද, 2024 වසරේ අත්තිකාරම් වලින් බහුතරයක් නිරවුල් කර ඇති බව හා ඉතිරි අත්තිකාරම් මුදල් ද නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතින බව.	-එම-
(iv)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් හඳුන්වාදුන් මුදල් රෙගුලාසි 756 (6)	සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ඉදිරි වර්ෂයේ මාර්තු 31 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත් ප්‍රාදේශීය මධ්‍යස්ථාන 28ක සහ ප්‍රධාන කාර්යාලයේ අංශ 03ක වටිනාකම රු.16,707,354ක් වූ පාඨමාලා ද්‍රව්‍ය, ඇදීම් උපකරණ සහ අනෙකුත් තොග සමීක්ෂණ වාර්තා මේ දක්වාම විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.	ඉදිරිපත් නොකළ අංශ 03හි වාර්තාවල නිරවද්‍යතාවය පරීක්ෂා කර කඩිනමින් ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව.	-එම-

(ඈ)	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව සහ උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහයේ V වැනි පරිච්ඡේදයේ 7.6 වගන්තිය	1984 සිට 2024 වර්ෂය දක්වා කාලසීමාව තුළ බැඳුම්කර ගිවිසුම් කඩකරන ලද නිලධාරීන් 44 දෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු.284,510,353ක ශේෂය අදාල නිලධාරීන්ගෙන් හෝ ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	නිළධාරින් 06 දෙනෙකුගේ බැඳුම්කර වටිනාකම අර්ථ සාධක අරමුදලින් ද, තවත් පිරිසකගේ අයවීම් ඔවුන්ගේ කැමැත්ත ලබාගෙන අර්ථ සාධක අරමුදලින් හා පාරිතෝෂිකයෙන්ද නිළධාරින්4 දෙනෙකුට නීති මගින්ද, බැඳුම්කර කඩකර වසර දහය ඉක්මවා ඇති නිළධාරින් 13 දෙනෙකුගේ අර්ථසාධක අරමුදලේ ඇති ශේෂයෙන් ඔවුන්ගේ කැමැත්ත ප්‍රකාශ කරන ලිපිය රහිතව අය කර ගැනීම සඳහා ලිපියක් කැබිනට් අනුමැතියට යැවීම සඳහා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත යවා ඇති බව හා අනෙකුත් නිළධාරින්ට සිහිකැඳවීම් යවා ඇති බව.	ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කල යුතුය.
(ඈ)	1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	2024 දෙසැම්බර් 31 දිනට පිරිවැය රු.19,788,066,126ක් වූ දේපළ, පිරියත හා උපකරණ සහ පිරිවැය රු.29,626,511ක් වූ අස්පෘෂ්‍ය වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කර නොතිබුණි.	පරිගණක පද්ධතියේ ස්ථාවර වත්කම් ලේඛණය ක්‍රියාත්මක නොවූවත් අවසන් ගිණුම් වාර්තාවල විස්තරාත්මක උපලේඛන වලින් හා සටහන් මගින් සියළු තොරතුරු ලබා දී ඇති බව.	චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.
(ඉ)	2023 ජනවාරි 18 දිනැති අංක BD/HRD/126/214/19/2023 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය	බැඳුම්කර ගිවිසුම් උල්ලංඝනය කිරීම මත ප්‍රවර්තන වර්ෂය තුලදී අයකරගන්නා ලද රු.12,693,868ක මුදල සහ ඊට පෙර ලැබී තිබුණු රු.169,105,107ක මුදල භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.	විශ්වවිද්‍යාල ගිවිසුම් කඩකිරීමෙන් ලැබෙන ආදායම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛ 737 මගින් සඳහන් කර ඇති විධිවිධාන අනුව කටයුතු කර ඇති බව.	භාණ්ඩාගාර චක්‍රලේඛ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.1,209,721,310ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.726,456,883ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.483,264,427ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ශිෂ්‍ය ආදායම රු.612,712,154කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මුළු කොන්ත්‍රාත් වටිනාකම රු.378,852,836+VATක් වූ සෞඛ්‍ය විද්‍යාපීඨයේ මහල් 5කින් යුතු ගොඩනැගිල්ල සැලසුම් කිරීම හා ඉදිකිරීම් (Design & Build) යටතේ 2022 සැප්තැම්බර් 19 දින වැඩ අවසන් කිරීමට නියමිතව තිබුණ ද මෙම වාර්තාවේ දිනය වන විටත් කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන්වී නොතිබුණි. 2023 ජනවාරි 25 දිනැති මුදල් ආර්ථික ස්ථායිකරණය හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ අනුව ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගැනීමකින් තොරව වන්දි වශයෙන් කොන්ත්‍රාත්කරුට රු.127,624,573ක් (VAT සමඟ) ගෙවීම් සිදු කර තිබුණි.	සියළුම කොන්ත්‍රාත් දීර්ඝ කිරීමේ නිර්දේශ උපකුලපතිතුමාගෙන් ලබාගෙන ඇති අතර 2025 පෙබරවාරි 28 දින සිට ඉදිරි දින සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුව කටයුතු කිරීමට නියමිත බව. කොන්ත්‍රාත්කරු විසින් රටේ පැවති තත්වය සහ අමාත්‍යාංශ නිර්දේශ මත ඉදිරිපත් කර මිල විචලනයන් පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් පත්කළ ත්‍රිපුද්ගල කමිටුව විසින් එය පරීක්ෂා කර ගෙවීම් සඳහා නිර්දේශ ලබාදුන් අතර ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියද ලබාගෙන ඇති බව. මෙම ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්කරුට එක වර ගෙවීම් නොකරන ලද අතර කොන්ත්‍රාත් ඉදිකිරීමේ කෙටිකාලීන ඉලක්ක ලබාදී ඒ අනුව ප්‍රතිශත වශයෙන් ගෙවීම් කරන ලද බව.	ගිවිසුම් ප්‍රකාරව සැලසුම් කළ කාලපරිච්ඡේදය තුළදී ඉදිකිරීම් නිමකරවා ගැනීමට කටයුතු කළ යුතු අතර මිල විචලනයන් ගෙවීම් කිරීමේදී ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුවේ නිර්දේශ ලබාගැනීමට කටයුතු කළ යුතුය.

3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
විද්‍යාත්මක ප්‍රදර්ශන සඳහා යොමු කිරීම, ක්ෂේත්‍රගත පර්යේෂණ හා නව නිෂ්පාදන මහජනතාවට හඳුන්වාදීම වැනි අරමුණු සඳහා භාවිතා කිරීමට අපේක්ෂාවෙන් 2023 අප්‍රේල් මාසයේ වැඩ නිම කර තිබූ පිරිවැය රු.9,989,000ක් වූ ජංගම පර්යේෂණාගාරයක් ලෙස සකස් කරන ලද බස් රථය වසර 2ක් තුළ කි.මී.404ක් පමණක් ධාවනය කර, අවස්ථා කිහිපයක දී පමණක් විද්‍යාත්මක ප්‍රදර්ශණ සඳහා යොමු කර තිබීම හේතුවෙන් එම බස්	ධාවනය කරන ලද කිලෝ මීටර් ගණන අනුව කාර්යසාධනය මැනීම සාධාරණ නොවන අතර කොපමණ ශිෂ්‍ය ප්‍රමාණයකට ඉගැන්නුවාද හෝ විවිධ මහජන ප්‍රදර්ශන වලට සහභාගී වූන අවස්ථා ප්‍රමාණය වඩා හොඳ කාර්යසාධන දර්ශකයක් බව හා මෙම ජංගම පර්යේෂණාගාරය භාවිතා කර පසුගිය වසරේ ශිෂ්‍යයන් 300කට පමණ ඉගැනුම් කටයුතුද විවිධ පාසැල් වලට රැගෙන යාම්ද, මහජන ප්‍රදර්ශන	මිලදී ගත් අරමුණ සඳහා ඵලදායීව යෙදවීමට කටයුතු කළ යුතුය.

රථය ඌන උපයෝජිතව පැවතුණි.	වලට ද සහභාගී වීම් ද කර ඇති බව. එහිදී දිනකට සිසුන් 100කට පමණ දැනුම ලබාදී ඇතති අතර තවදුරටත් ජාතික විද්‍යා පර්යේෂණ ආයතනය වැනි ආයතන සමඟ සම්බන්ධ වී මෙම ජංගම පර්යේෂණාගාරය වැඩි වැඩියෙන් භාවිතා කිරීමට කටයුතු කරමින් පවතින බව.	

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
2021 නොවැම්බර් 16 දිනැති භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුකූලව නිකුත් කළ ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ 2.3 පරිච්ඡේදය හා ඇමුණුම I අනුව විශ්වවිද්‍යාලය වාර්ෂිකව සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් වෙනුවට වර්ෂ 05කට සකස් කරන ලද ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර තිබුණු අතර එහි එක් එක් ක්‍රියාකාරකම සඳහා වර්ෂය තුල ඉලක්කගත කාලය හා එක් එක් ක්‍රියාකාරකම සඳහා වැයවෙතැයි අපේක්ෂිත වියදම හඳුනාගෙන නොතිබුණි.	ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශයේ ඇමුණුම I අනුව කාලරාමු හා ඇස්තමේන්තුගත පිරිවැයන් ඇතුලත් ක්‍රියාකාරී සැලැස්ම ඉතා ඉක්මනින් විගණනයට ඉදිරිපත් කරන බව.	ආයතනික යහපාලනය පිළිබඳ මාර්ගෝපදේශය අනුව කටයුතු කල යුතුය.